වාඩි වී සිටි අසුනින් නැගිට ඇය අසළට එන අතරය.

ඔහු කියන්න වටහා ගැනීම අසීරු නැත. එනමුදු අදහසක් ලෙය යමක් ප්‍රකාශ නොකර බලා සිටීම වඩා සුදුසු යයි සමදරා සිතුවාය.

"මං විදුල ලවා අර ඩොකියුමන්ට්‍රිය කරන්න හදපු එක තමයි හේතුව.. ඒ අසරණයා මං හින්දයි කරදරේ වැටුණෙ.." සාරානන්ද කීවේය.

"ඒත් අපි හරියටම දන්නැහැනෙ සර් මේක කාගෙ වැඩක්ද කියල ..." සමදරා කීවේ සිතට එකඟව නොවේ. ඇමතිවරයා ඇගේ කතාවට ප්‍රතිචාර දැක්වූයේ අවඥාසහගත සිනාවකිනි.

"බොරු ඇද බාන්න එපා මැඩම්.." ඇමතිවරයා කීවේ සිනාව අතරදීමය. ".. මුලු ලංකාවම දන්න දෙයක් ඔයා නොදැනගෙන ඉන්නෙ කොහොමද..? අයිසෙ මේ අහනවා.. තමුසෙලා උගත් මිනිස්සු ගෑනු.. ලොක්කො සන්තෝස කරන්න උන් ඉස්සරහ බොරු ඇදබාන එක තමුසෙලට ගැලපෙන්නෙ නැහැ කියන එක තේරුම් ගන්නවා.. තමුසෙල වගේ එහෙයියො හින්ද තමා මේ දේශපාලකයො හොඳටම නරක් වෙලා තියෙන්නෙ.. කොන්ද කෙළින් තියාගෙන ඇත්ත කියන්න පුරුදුවෙනවා ළමයෝ.. ආත්ම ගෞරවය රැකගෙන ඇත්ත කියලා ගෙදර යන්න වුණත් ළෑස්තියෙන් හිටිය සිවිල් සර්වන්ට්ස්ලා ලංකාවෙ අනන්තවත් හිටියා.. ඒ මිනිස්සු ගෑනු ගැන අදත් අපි ගෞරවයෙන් කතා කරනවා"

සමදරාගේ මුහුණ විලියෙන් රතුව යනු වියපත් දේශපාලකයාගෙන් දුටුවේය.

"නෑ සර්.. මං.. මේ.. කිව්වෙ.."

සමදරා වාඩිවී සිටි පුටුව අසළින්ම මේසයට වාරු වූ ඇමතිවරයා පහත් වී ඇය දෙස බැලුවේය.

"මේ වගේ දෙයක් මේ ආකාරයට සිද්දවෙන්න පුලුවන් කොහොමද කියන එක රහසක් නෙවෙයි සමදරා.." ඔහු කීවේ පහත් හඬිනි. ".. මාත් මේ ආණ්ඩුවෙම මිනිහෙක්නෙ.. මේ යන්තරේ වැඩ කරන හැටි කවුරුත් දන්නවා.. ඒතා කාටවත් කතා කරන්න හයියක් නැහැ.." ඔහු නැවත ගොස් සිය අසුනේ වාඩි වී සුදු ලේන්සුවකින් මුහුණේ නැගී තිබූ ඩා බිඳු පිසදා ගත්තේය. "...මිනිස්සු අපට බණින එක පුදුමයක් නෙවෙයි කියලා මං දන්නවා.." ලේන්සුව මුවාවේ සිට ආ ඔහුගේ කටහඬ ඇයට ඇසුණි.

සමදරා නිහඬව අසා සිටියාය.

"මට කෙළින් ගහන්න බැරි කමට විදුලට ගැහුවා.. ගහලා වැඩේ නැවැත්තුවා.. අවුරුදු තිහ හතළිහක් මං නම්බුකාර දේශපාලනයක් කළා.. මේ වගේ අවලංගු වෙලා හිටපු කාලයක් මගෙ ජීවිතේටම තිබුණෙ නැහැ.. අපි නිකම් පඹයො වගේ පෙනී හිටිනවා විතරයි.. ඒ පිළිවෙතින් පොඩ්ඩක් හරි මෑත්වෙන්න හදනකොට - පොඩ්ඩක් හරි ඉස්සරහට එන්න හදනකොට - වෙන්නෙ මේ වගේ දේට මූණ දෙන එක තමයි.."

සමදරා සිත යටින් සිනාසුණාය. මේ සියල්ල තේරුම් ගන්නා අතරේදීම මේ මිනිසුන් එකට එක්ව සිටින්නේ, එක්ව ගමනක් යන්නේ, කෙසේදැයි ඇයට වටහා ගත නොහැකිය. "ආත්ම ගෞරවයක් නැතිකම.. අත්මාභිමානයක් නැති කම.. නිවටකම.. බඩගෝස්තරවාදය" ඇයම සිතින් පිළිතුරු බැන්දාය.

මේස ලාච්චුවෙන් ගත් චෙක් පොතකින් චෙක් පතක් ලියූ සාරානන්ද එය මේසය හරහා සමදරා වෙත තල්ලු කළේය.

"නිරාශට දෙන්න.. මේක මගේ පුද්ගලික එකවුන්ට් එකෙන්.." ඔහු කීවේය. සමදරා ලියා ඇති ගණන නොබලාම චෙක්පත සිය අත්බෑගයට දමා ගත්තාය.

"අපි දැන් මොකද කරන්නෙ සර්..?" ඈ ඇසුවාය. ඔහු හැඟීම් විරහිත හුමුණින් ඇය දෙස බලා සිටියේය. ඇගේ සරළ ප්‍රශ්නයට පිළිතුරක් නැත. මහා සුළි සුළඟක් ඉදිරියේ පරඬලා පත් වලට ස්වයං චලනයක් නැති බව ඔහු දනියි. මේ ප්‍රවාහයේ ගසාගෙන යනවා විනා එයට එරෙහි ගමනක් පිළිබඳ සිතන්නටවත් හැකියාවක් නැත. යම් දිනෙක යම් කිසිවකු විසින් මේ සියල්ල වෙනස් කරනු ලබන තෙක් බලා සිටිනු හැරෙන්නට කළ හැකි වෙනත් යමක් නැත.

"කරන්න දෙයක් නෑ සමදරා.. අපිම අත් උස්සල දුන්න බලයනෙ.. මේ ක්‍රමේ හැදුවට අපි විපක්ෂෙ ඉන්නකොට ජේ ආර්ට පලු පැළෙන්න බැන බැන හිටියා.. ඒත් අද ඒ ක්‍රමේ වෙනස් කරන්න පුලුවන් කම තියෙද්දිත් අපි බකං නිලාගෙන බලා ඉන්නවා.. අඩුම ගානෙ ලොකු තැන් වලට ඒක මතක් කරල දෙන්නවත් හයියක් අපි කාටවත් නැහැ.. හැමෝම කසාය බිව්ව ගොලුවො වගේ බලා ඉන්නවා.. බලා ඉමු.. ඔහේ බලා ඉමු.. හෙට පත්තරකාරයොයි ෆිල්ම් ගිල්ඩ් එකේ අයයි උද්ඝෝෂණයක් කරනවලු විදුල වෙනුවෙන්... ඒ මිනිස්සුන්ට ඒ වගේ දෙයක් හරි කරන්න පුලුවන්.. අපට එහෙමවත් විරෝධයක් පාන්න හැටියක් නැහැ.. ඔහේ දෙන දෙයක් කාලා වෙන දෙයක් බලා ඉන්න එක තමයි අපට තියෙන්නෙ.." සාරානන්ද කීවේය. "..අද ඇමති කම කියන්නෙ සීල් එකක් විතරයි දරුවො.."

000000







හසන්ත තමා දෙස නොබලා ඉවත බලා සිටින නිරාශා දෙස බලා සිටියේය. දැන් කොපමණ වේලාවක් ඇය මෙසේ සිටින්නට ඇතිද? ඇය ඉදිරියේ මේසය මත වූ කෝපි කෝප්පය දැන් ඇල් වී ඇතැයි ඔහුට සිතුණි.

"කෝපි එක බීලා ඉන්න.." ඔහු කීවේය. "..උදේ ඉඳන් මොනාවත් කෑවෙවත් නැහැ නේද?"

දුර ඈත ඉලක්කයකට එල්ල වී තිබූ සිය බැල්ම ඔහු දෙසට යොමු කළ නිරාශා සුසුමක් හෙළා කෝපි කෝප්පය අතට ගත්තාය.

"ඔයා නොදැනුවත්ව මේ වගේ දෙයක් වෙන්න විදිහක් නැහැ හසන්ත" ඇය කීවේ මෙතෙක් වේලා සිතේ තෙරපෙමින් වද දුන් අදහසය. ඒ අදහස විසින් මතු කරනු ලබන අවිනිශ්චිතතාව විසඳා ගන්නාතෙක් ඔහු සමග මොනයම් ආකාරයක හෝ ගමනක් තිබිය නොහැකිය.

හසන්ත එකවරම පිළිතුරක් නොදුන්නේය. ඇය තමා අවිශ්වාස කිරීම පුදුමයක් නොවන බව ඔහු දනියි. එය බලාපොරොත්තු විය හැකි - බලාපොරොත්තු විය යුතු තත්වයකි.

එදින උදෑසන මාධ්‍ය ඒකකයේ අධ්‍යක්ෂවරයා කී කතාව හසන්තගේ සිහියට එයි.

"අයිසෙ හසන්ත මේක මේ තමුසෙත් එක්ක තරහවකට ලිව්ව කතාවක් නෙවෙයි.. තමුසෙ වගේ කෙනෙක් ගාවලා මේක නිර්මාණය කළාම ඒකෙ විශ්වාසනීයත්වය ගැන කවුරුත් සැක නොකරණ බව හැමෝම දන්නවා.. එච්චරයි.."

"ඒ වුණාට මේක මහ කැත වැඩක්.. අන්තිම පහත් වැඩක්.. අමුම අමු බොරුවක් ප්‍රචාරය කරනවා මදිවට තමන් එක්ක එකට ඉන්න මිනිහෙකුත් මේ වගේ තැනකට ඇදල දාන එක අන්තිම පහත් වැඩක්.." හසන්ත කෝපයෙන් කෑගැසුවේය.

"දේශපාලනයෙදි කැත වැඩ පහත් වැඩ කියල ජාති නැහැ හසන්ත .. මේ හැම වැඩක්ම අවශ්‍යයි.. අත්‍යවශ්‍යයි.. මේකෙදි කවුරුවත් වැදගත් නැහැ... වැදගත්වෙන්නෙ මිනිස්සු නෙවෙයි.. මිනිස්සුන්ට වඩා පැවැත්මයි වැදගත්.. " මාධ්‍ය අධ්‍යක්ෂක කතා කරන්නේ ඉතා සැහැල්ලුවෙනි. ඒ සැහැල්ලු විලාශය හසන්තගේ සිතේ ඇති කෝපය තවත් අවුලුවයි. මේ මිනිසුන් මේ සෙල්ලම් කරන්නේ තවත් අහිංසක මිනිසුන් රැසකගේ ජීවිත සමගින් නොවේද? ඒ පිළිබඳව තඹයකුදු මායිම් නොකර මේ සා සැහැල්ලුවෙන් කතා කරන්නට කිසිවකුට හැකියාවක් ලැබේ නම් ඔහු පිළිබඳ ගත හැකි තක්සේරුව කුමක්ද?

"එතකොට තමුසෙද මේකෙ නිර්මාතෘවරයා..?" හසන්ත අසන්නේ ඉහ වහා ගිය කෝපයෙනි.

"නිර්මාතෘවරයා කවුද කියලා හොයන්න මහන්සිවෙන්න එපා හසන්ත.. මේක ගැන කලබල වෙන්නත් එපා.. වැඩිම වුණොත් තව මාසයයි.. ඊට පස්සෙ ඔය කතාව හෙමින්ම යට යයි.. මිනිස්සුන්ට ඔයාව විතරක් නෙවෙයි විදුලවත් අමතක වෙලා යයි.. ඒක තමයි අපේ රටේ ක්‍රමේ.. අවශ්‍යවෙන්නෙ කාලය ගන්න ක්‍රමයක් විතරයි.. ගතවෙන හැම දවසක් පාසාම මේව අපේ මිනිස්සුන්ගෙ හිත්වලින් මැකෙනවා.. පොඩ්ඩක් කල්පනා කරල බලනවකො.. පහුගිය කාලෙ වෙච්ච දේවල් හැටියට අද මෙහෙම ආණ්ඩුවක් පවතින්න විදිහක් තියෙනවද කියල.. මිනිසසුන්ට ගැහුව නෙවෙයි.. කී දෙනෙක් වෙඩි තියල මරල දැම්මද? කෝ අද සද්දයක්..? දවසක් දෙකක් කෑ ගහනවා.. ඊට පස්සෙ හැමෝම නිදාගන්නවා.. එච්චරයි.. ඒක තමයි අපේ රටේ ක්‍රමේ.. ඒ නිසා පොඩ්ඩක් සද්ද වහලා ඉන්න.." මාධ්‍ය අධ්‍යක්ෂක කියන්නේ හසන්ත අසළට එන අතරය. හසන්තගේ දෙඋරහිසට දෑත් තබාගත් ඔහු පහත් හඬින් කතා කළේ ය. "....දැන් බොස් හමුවෙන්න යන්න එපා.. ඒක මේ සැළැස්මට ගැළපෙන්නෙ නැහැ.. ටික දවසක් ඈත් වෙලා ඉන්න.. අවශ්‍ය වෙලාවට බොස් කතා කරයි"

**මතු සම්බන්ධයි**






# SPRING

*Spring is finally here*
*And it brings days of heat and clear skies*
*Followed by nights with cool winds*
*And all animals will come out from their sleep*
*Or return from anywhere they travelled for winter*
*Flowers will bloom*
*Adding a bit more colour*
*Children will be back outside again*
*Playing and laughing*
*And we will all cheer*
*Because spring will finally be here*

It is finally spring now, after months of cold and rain we have reached one of the most favoured seasons. Spring is known as the transformation from winter to summer, in between the freezing cold days and those nights in which you just can't seem to fall asleep. Spring is when the flowers start to bloom, animals come out from hibernation and shed of their winter coats and children are back outside enjoying the warm weather.

The first day of spring is called the vernal equinox where vernal means spring and equinox means equal night's spring is the season when days and nights would become the closest to 12 hours each. Spring is the season for which farmers will look forward to the most because it is the season which when their crops will flourish and their produce would be at their finest. Spring is thought to be the season for rebirth, rejuvenation, renewal, resurrection, and regrowth. In Greece Persephone was the goddess of spring, she spent winters as Queen of the Underworld but returned in spring to return to the world. Did you also know that before we called this season spring it used to be called Lent or Lenten. Spring is all the birds come home after migrating for the winter time, did you know that around 1850 species of birds migrate? Spring is also the season in which animals such as cows and ducks lay eggs or have babies. Flowers are definitely associated with spring, the most common flowers that would bloom in spring are daffodils, tulips and lilies.

When spring arrives the sun rises early in the morning and sets late in the afternoon, because of this we can enjoy longer days and shorter nights. Although it will be mostly warm in spring some days might be very windy and cold while other days would be scorching hot when it is nearing to summer. In spring it is the time that you could expect the most floods because of the melting ice in countries where it may snow in the winter. Another natural disaster that is usually associated with spring are hurricanes, the season for hurricanes usually start near the end of spring. Do you know why it starts to become warmer during spring? It is because the Earth's axis starts tilting towards the sun.

Spring is my favourite season of the year because the weather is not too cold nor is it too hot. It is the perfect time to enjoy them outdoors. At spring the sound of birds chirping become more regular and sweeter. Days welcome you with a subtle heat which ends up as cool nights. Flowers start to bloom and gardens that had withered away during wither are packed with flowers with different colours, shapes and sizes. All animals that had travelled south for the winter would return with their whole group while new baby animals will be born. The grass would be at its greenest while the trees will be at their most flourished. We will be able to just laze around in the outdoors and enjoy the lovely weather because finally spring has arrived.

It's time to go outside now and enjoy this beautiful weather because "cold weather" is not an excuse anymore. In this article I told you some facts about spring to get you excited about the upcoming season. I hope that everyone gets outside and enjoys this lovely weather and make the most out of these warm days. I hope everyone stays safe and make the most out of these few months.